**ශීර්ෂය 238 - රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව**

----------------------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

-----------------

**1.1 මතය**

---------

ශීර්ෂය 238 - රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 ජුනි 16 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 අගෝස්තු 05 දින ගණන්දීමේ නිලධාරියා වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ .

**1.2 මතය සඳහා පදනම**

----------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත .මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---------------------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 ආදායම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අංක 20.05.01.00 දරන මහ බැංකුවේ ලාභ ආදායම් සංකේතය යටතේ 2021 වර්ෂය සඳහා මූලික ආදායම් ඇස්තමේන්තුව මගින් රු.බිලියන 20 ක ආදායමක් ඇස්තමේන්තු කර තිබුණි. අතාත්ත්වික ලෙස මූලික ආදායම් ඇස්තමේන්තුව පිළියෙල කර පසුව එම ඇස්තමේන්තුව තවත් රු.බිලියන 5 කින් වැඩි කර රු.බිලියන 25 ක් ලෙස දක්වා සංශෝධනය කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදි එම ආදායම් සංකේතයෙන් රු.බිලියන 15 ක ආදායමක් රැස්කර තිබුණි. ඒ අනුව එම ආදායම් සංකේතය යටතේ ආදායම් ඇස්තමේන්තුව තාත්ත්වික හා නිවැරදි ලෙස පුරෝකථනය නොකිරීම නිසා මූලික ඇස්තමේන්තුවෙන් අපේක්ෂා කළ ආදායමෙන් සියයට 75 ක ආදායමක් පමණක් රැස්කිරීමට හැකි වී තිබුණි. | ආදායම් ඇස්තමේන්තු සකස් කිරීමේ දී එවකට පැවති ආර්ථිකයේ තත්ත්වය සැළකිල්ලට ගනු ලබයි. 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මහ බැංකු ලාභ ලෙස රු. මිලියන 30 ක් 2022 පෙබරවාරි මාසයේදී මහා භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කර ඇත. ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වීමෙන් පසුව ලාභ ලබා දීම සිදු වී ඇත. ආදායම් ගිණුම පිළියෙළ කිරීමේ දී මුදල් පදනම මත ආදායම ගණනය කරන අතර උපචිත ආදායම් දැක්විය නොහැක. | ඇස්තමේන්තු තාත්ත්විකව හා නිවැරදිව පිළියෙල කළ යුතු වීම. |
| (ආ) | මූල්‍ය ප්‍රකාශනවල ආදායම් සංකේතය 1002.10.00 සමාජ වගකීම් බද්ද ලෙස රු.64,598,346 ක හිඟ මුදලක් පවතින බව සඳහන් කර තිබුණි. එම හිඟහිටි ආදායමෙන් සියයට 0.01 හෙවත් රු.5,820 ක ආදායමක් සමාලෝචිත වර්ෂයේදි රැස්කර තිබුණි. එමෙන්ම එම හිඟහිටි ආදායමෙන් රු.1,449,239 ක් කපා හැර තිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම ආදායම් සංකේතය යටතේ රු.63,143,287 ක ආදායමක් හිඟහිටව පැවැතුණි. | ආදායම් සංකේතාංක 1002.10.00 සමාජ වගකීම් බද්ද යටතේ වන බදු ආදායම එකතු කරන ආයතන වන දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සහ රේගු දෙපාර්තමේන්තුව වෙත ඊට අදාළ හිඟහිටි ආදායම් රැස් කර ගැනීමේ වගකීම ද පැවරේ. මෙම දෙපාර්තමේන්තුව මගින් නිරන්තරව සිහි කැඳවීම් යැවීම හා අදාළ කමිටු පිහිටුවා එකී ආයතන වෙත හිඟහිටි ආදායම් අප්‍රමාදව එක්රැස් කිරීම සම්බන්ධව උපදෙස් ලබාදීමට කටයුතු කර ඇත. | හිඟහිටි ආදායම් කඩිනම්ව රැස්කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

## 2.2 වියදම් කළමනාකරණය

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) සලසා තිබුණු ප්‍රතිපාදන නිෂ්ඵලවීම** | | |
| 238-1-1-1102 වැය විෂය සඳහා රු.1,000,000 ක ශුද්ධ ප්‍රතිපාදනයක් සලසා තිබුණත්, සමාලෝචිත වර්ෂයේදී ඉන් කිසිදු උපයෝජනයක් නොකිරීම නිසා එම මුළු ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි. | 238-1-1-0-1102 යන වැය විෂය සඳහා රු.3,000,000 ප්‍රතිපාදන ප්‍රමාණයක් 2021 වසර සඳහා වෙන්කර ඇති අතර, එයින් රු.2,000,000 ක ප්‍රතිපාදන ප්‍රමාණයක ප්‍රගතියන් පෙන්නුම් කර ඇත. එමෙන්ම, කෝවිඩ් -19 වසංගත තත්ත්වය හේතුවෙන් දෙපාර්තමේන්තු නිලධාරින්ගේ විදේශිය පුහුණු සහ සම්මන්ත්‍රණ සඳහා සහභාගිවීම් අත්හිටුවීම මත ඉතිරි ප්‍රතිපාදන ප්‍රමාණය උපයෝජනය නොවිය. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදිව හා තාත්ත්විකව වාර්ෂික වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. |
| **(ආ) අධි ප්‍රතිපාදන සලසා ගැනිම** | | |
| සමාලෝචිත වර්ෂයේදී වැය විෂයයන් 05 ක් සඳහා එකතුව රු.25,598,373 ක අධි ප්‍රතිපාදන සලසා තිබුණු අතර ඉන් රු.15,488,341 ක උපයෝජනයක් කර තිබුණි. ඒ අනුව රු.10,110,032 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. එම ඉතිරිය එක් එක් වැය විෂයයන් සඳහා සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 16 ක සිට සියයට 75 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වි තිබුණි. | සැලසුම් කළ පරිදි අළුත්වැඩියාවන් සිදු නොකිරීම, පොලී අනුපාතයන් අඩුවීම හේතුවෙන් පොලී ගෙවීම් වටිනාකම අඩුවීම. දෙපාර්තමේන්තු නිලධාරීන් කොවිඩ් 19 වසංගත තත්ත්වය නිසා සේවයට පැමිණීම සීමා කිරීම. වාර්ෂික වාර්තා හා අයවැය වාර්තා මුදල් අමාත්‍යාංශයේ වියදමින් ඉටුකිරීම නිසා ප්‍රතිපාදන ඉතුරුවීම. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදිව හා තාත්ත්විකව වාර්ෂික වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. |

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

-----------------------------------------------------

නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | **නීති,රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| (අ) | 2021 නොවැම්බර් 26 දිනැති අංක 2021/03 දරන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශය | මුදල් ප්‍රවාහ ප්‍රකාශය දළ පදනම මත පිළියෙල නොකිරීම නිසා මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයේ අත්තිකාරම් ලැබීම් හා ගෙවීම් පිළිවෙලින් රු.2,749,698 ක් හා රු.2,513,761 ක් අඩුවෙන් දක්වා තිබුණි. | විගණන නිරීක්ෂණ සමඟ එකඟ නොවේ. මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දැක්විය යුතු වන්නේ මුදල් ප්‍රවාහයේ සිදු වූ වෙනස්කම් පමණක් වන අතර හරස් සටහන් මඟින් සිදු කළ ගනුදෙනු වල අගයන් අතුළත් කළහොත් ආයතනයට සත්‍ය වශයෙන්ම සිදු වූ මුදල් ගලා ඒම් ගලා යාම් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ වැඩිපුර දැක්වීමක් සිදු වේ. මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ වියදම් ද දක්වා ඇත්තේ දළ වියදමට හරස් සටහන් මඟින් වූ ගනුදෙනු ගැළපීමෙන් පසුව වන අගයන්ය | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශ අනුගමනය කරමින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම විධිමත් කළ යුතු වීම. |
| (ආ) | මුදල් රෙගුලාසි 104 හා 110 | දෙපාර්තමේන්තුව සතු වාහනයකට අනතුරකින් සිදු වී තිබුණු හානිය සම්බන්ධයෙන් ප්‍රාරම්භක වාර්තාවක් හා පූර්ණ වාර්තාවක් පිළියෙල කර ඉදිරිපත් කර නොතිබුණු අතර, අලාභහානි ලේඛනයේද එම අලාභය සටහන් කර නොතිබුණි. | විගණන නිරීක්ෂණ සමඟ එකඟ වේ. වාර්තා වූ හානිය සඳහා අනුමැතිය අදාළ ගොනුව හරහා ලබා තිබුණද හානිවීම් ලේඛනයෙහි සටහන් කිරීම හා අනතුරු සම්බන්ධ ප්‍රාරම්භක වාර්තාව ඉදිරිපත් කිරීමට මින් ඉදිරියේදී කටයුතු කරන බව දන්වමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු විම. |

## 3. මානව සම්පත් කළමනාකරණය

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ අනුමත වූ තනතුරු 62 කින් තනතුරු 16 ක් පුරප්පාඩුව පැවතුණි. එම පුරප්පාඩු තනතුරු තුළ ජ්‍යොෂ්ඨ මට්ටමේ තනතුරු 06 ක් පැවතුණි. | පවත්නා කාර්යාල කාමර ප්‍රමාණවත් නොවීම නිසා ජ්‍යොෂ්ඨ මට්ටටමේ තනතුරු 06 ක පුරප්පාඩු පිරවීමට නොහැකි වී ඇත.<br><br>පරිපාලන නිලධාරී තනතුර සඳහා නිලධාරිණියක අනුයුක්ත කරන ලෙස ඉල්ලා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත ලිපියක් ඉදිරිපත් කර ඇත.<br><br>මේ වන විට අනෙකුත් තනතුරුවල පුරප්පාඩු 07 ක් පමණක් පිරවීමට ඇත. | පුරප්පාඩු පිරවීමට හෝ කාර්ය මණ්ඩලය සංශෝධනය කර ගැනීමට හෝ කටයුතු කළ යුතු වීම. |